- **ක්ෂුද්‍ර පෝෂක යෙදීම**

  විශාල වශයෙන් පාංශු ඛාදනයට ලක්වී ඇති වගා බිම් සඳහා අවශ්‍ය පරිදි ක්ෂුද්‍ර පෝෂක අඩංගු පොහොර වගාවේ මූලික අවස්ථාවේ යෙදීම. (වගාව දනිස් මට්ටමේ උසට පැමිණීමට පෙර)

- **ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම භාවිතය**

  ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම හා පොහොර ජල සම්පාදනය තුළින් අස්වැන්න හෙක්ටයාරයට මෙ.ටොන් 10ක් පමණ දක්වා වැඩිකරගත හැකි බව ප්‍රායෝගික අත්දැකීම් තුළින් සනාථ වී ඇත.



- **වල් මර්ධනය**

  වගාවේ මුල් සති 6 වල් පැළවලින් තොරව තබාගන්න. බීජ පේළියට දැමීම, වල් නෙලන යන්ත්‍ර භාවිතය පහසු කරයි.

  පස කෙටෙන පරිදි වල් මර්ධනය කිරීමෙන් හා පස් ලංකිරීම මඟින් වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

- **රෝග පළිබෝධ**

  වගාව ආරම්භයේ සිට නිතිපතා නිරීක්ෂණ හා ඒකාබද්ධ පලිබෝධ පාලන ක්‍රම භාවිතා කිරීම.

  - පැළ වලට සති 2-3 පමණ වයසේදී පැළයේ ගොබයට ඩයසිනෝන් 5% කැට කීපය බැගින් යෙදීම.



*පුරුක් පණුවාගේ හානිය*



*සදර්න් මලකඩ රෝගය*

***රෝගී තත්ත්වයන් දුටු වහාම නිවැරදි හඳුනාගැනීම් හා පාලන ක්‍රම සඳහා ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක විමසන්න.***

- **පසු අස්වනු තාක්ෂණය**

  හොඳින් වියලා ගබඩා කරන්න. තෙතමනය 14% ට වඩා අඩු විය යුතුය.



- **අලෙවිකරණය**

  හොඳින් වියලා ගබඩා කිරීම මඟින් ඉතා හොඳ මිලක් ලබාගත හැකිය. පෙර ගිවිසුම් අත්සන් කිරීම මඟින් අලෙවිය පිළිබඳව ඇතිවන ගැටළු අවම කරගත හැක.


**වැඩි විස්තර**

අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය
දුක : 0812 388 098
ෆැක්ස් : 0812 387 403

පී.ඒ.පී. විමලරත්න
බෝගනායක (බඩඉරිඟු)
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්), අනුරාධපුරය.
දුක : 0252 235 037



මුද්‍රණ අනුග්‍රහය : බඩඉරිඟු නිෂ්පාදනය වැඩිකිරීමේ ව්‍යාපෘතිය - 2015
සැකසුම : ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව, පේරාදෙණිය


# බඩඉරිඟු

## වගාවෙන් වැඩි අස්වැන්නක් ලබමු ආදායම වැඩිකර ගනිමු




**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**

## හැඳින්වීම

යල සහ මහ කන්න වලදී හෙක්ටයාර 80,000ක් පමණ ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළ බඩඉරිඟු වගා කරනු ලබයි. වාර්ෂිකව මෙ.ටොන් 250,000 ක පමණ බඩඉරිඟු අස්වැන්නක් මෙම වගාවන් තුළින් ලබා ගනියි. නමුත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු වලට අනුව සත්ව ආහාර නිෂ්පාදනයේ ප්‍රධාන අමුද්‍රව්‍යක් වන බැවින් ශ්‍රී ලංකාවේ බඩඉරිඟු අවශ්‍යතාවය මෙට්‍රික් ටොන් 400,000 කි. මීට අමතරව ත්‍රිපෝෂ හා අනෙකුත් නිෂ්පාදන සඳහා තවත් මෙට්‍රික් ටොන් 15,000 ක් පමණ වාර්ෂිකව අවශ්‍ය වේ.

බඩඉරිඟු වගා කරනු ලබන ප්‍රධානම දිස්ත්‍රික්කය අනුරාධපුරය වන අතර එම ප්‍රමාණය හෙක්ටයාර 34,000 පමණ වේ. මීට අමතරව මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 23,000 ක් ලෙස ද, අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 12,000 ක් ලෙස ද, බදුල්ල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 8,000 ක් ලෙස ද ප්‍රධාන ලෙස බඩඉරිඟු වගා කරනු ලබයි.

ජාතික නිෂ්පාදන අවශ්‍යතාවය ලඟා කර ගැනීම සඳහා හෙක්ටයාරයට මෙ.ටොන් 3.2 ක් පමණ වන වර්තමාන සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට මෙ.ටොන් 5ක් දක්වා වැඩි කරගත යුතුව ඇත.

## බඩඉරිඟු වගාවේ ගැටළු

- මහ කන්නය තුළ වර්ෂාපෝෂිත ඉඩම් වල වගා කරන වගාවන් වල අස්වැන්න අඩු වීම.
- 95% පමණ බඩඉරිඟු බීජ පිටරටින් ආනයනය කිරීම
- නිෂ්පාදන වියදම වැඩිවීම

## වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමෝපායන්

- **සුදුසු බිම් තෝරා ගැනීම**
  හොඳින් ජලවහනය වන ගොඩ ඉඩම් හෝ කුඹුරු ඉඩම්

- **ඉහළ ගුණාත්මයෙන් යුතු බීජ භාවිතය**
  - MIH-1 දේශීය දෙමුහුම් ප්‍රභේදය
  - දේශීය නුමුහුම් ප්‍රභේද (රුවන්, භද්‍රා වැනි)
  - විදේශීය දෙමුහුම් ප්‍රභේද



- **වගා බිම්වල පස සංරක්ෂණය**
  සමෝච්ච වැටි, පස් වැටි, සැවැන්දරා වැටි යෙදීම මඟින් පස සෝදා යාම අවම කිරීම

- **කාබනික පොහොර හැකි තරම් භාවිතා කිරීම**
  - දහයියා අඟුරු, කොල පොහොර, සත්ව පොහොර, කොම්පෝස්ට් පොහොර
  - වගාවට පෙර සන්හෙම්ප් වගා කර 50% මල් පිපෙන විට පසට යට කිරීම. (අක්කරයට කි.ග්‍රෑම් 8ක්)

    හෝ

    බඩඉරිඟු පේලි අතර සන්හෙම්ප් බීජ වපුරා සති 2-3 කදී පසට යට කිරීම. (අක්කරයට කි.ග්‍රෑම් 20ක්)

- **යාය එකවර වගා කිරීම**
  - ගොවීන් එකතු වී යාය ලෙස, එකවර වගා කිරීම මඟින් කෘමි පලිබෝධ හානි අවම කර ගැනීම
  - යාය සමිති පිහිටුවීම තුළින් තාක්ෂණික පණිවුඩ කඩිනමින් ලබා ගැනීම හා යෙදවුම් සහ අලෙවි කටයුතු සම්බන්ධීකරණය පහසුකර ගැනීම

- **ගැඹුරට බිම් සැකසීම (අඟල් 9 පමණ) හා වගා භූමිය මට්ටම් කිරීම**

- **වගාව නියමිත පරතරයට පිහිටුවීම**

| | |
|---|---|
| වර්ෂාපෝෂිත ඉඩම් සඳහා | අඩි 2 x අඩි 1 - පැළ 1 බැගින් |
| | අඩි 2 x අඩි 2 - පැළ 2 බැගින් |
| වාරිපෝෂිත ඉඩම් සඳහා | අඩි 2 ½ x අඩි ½ - පැළ 1 බැගින් |

- **යන්ත්‍ර භාවිතය**
  බීජ සිටුවීම සඳහා යන්ත්‍ර භාවිතය තුළින් වල් නෙලන යන්ත්‍ර භාවිතය ද පහසු කරයි. මේ තුළින් වල් නාශක භාවිතය අවම කරගත හැකිය.



පස් වැටි දමන යන්ත්‍රය



බීජ වප්කරය



වල් නෙලන යන්ත්‍රය

- **නිර්දේශිත රසායනික පොහොර යෙදීම**
  අවම වශයෙන් යාය මට්ටමින් පස පරීක්ෂාකර පොහොර යෙදීම වඩාත් උචිත වේ.

| | යූරියා කි.ග්‍රෑ/ අක්. | TSP කි.ග්‍රෑ/ අක්. | MOP කි.ග්‍රෑ/ අක්. |
|---|---|---|---|
| මූලික පොහොර | 30 | 40 | 20 |
| මතුපිට පොහොර | | | |
| - වර්ෂාපෝෂිත | 60 | | |
| - වාරි ජල සම්පාදිත | 100 | | |

මතුපිට පොහොර ප්‍රමාණය දෙකට බෙදා සති 3-4 දී හා පිරිමි මල් පිපීම ආරම්භ වන අවස්ථාවේදී යෙදිය යුතුය.